බදුල්ල ප්‍රාදේශිය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
-----------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 03 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 10 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 16 දිනද, සභාපතිවරයාට යවා ඇත.

**1.2. තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට බදුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.40,751,758 ක් වූ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස දැක්වීමේදී රු.44,149,009 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,590,632 ක ණයහිමි ශේෂ 26 ක් වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| 127 වගන්තිය | සුසාන භූමි 25 කට අදාල ඉඩම්වල මැනුම් කටයුතු කර පවරාගෙන නොතිබුණි. | මැනුම් කටයුතු කර අදාල පවරා ගැනීම් කළ යුතුවේ. | සුසාන භූමි 02 මැනුම් කටයුතු සිදු කිරීමට දිස්ත්‍රික් මිනින්දෝරු කර්යාලය වෙත ලිපි භාරදී ඇති බවද 23 ක් සම්බන්ධයෙන් ප්‍රා.ලේකම් කාර්යාලය සමඟ සාකච්ඡා කර මැනුම් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,987,105 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,964,244 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,913,704 | 3,913,704 | 2,538,018 | 1,480,746 | 2,013,704 | 2,013,704 | 2,256,177 | 967,101 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 685,000 | 685,000 | 687,570 | - | 355,000 | 355,000 | 759,680 | - |
| (iii) | වෙනත් ආදායම් | 43,561,500 | 33,200,000 | 25,491,761 | 29,648,471 | 15,642,500 | 10,016,000 | 29,683,954 | 26,080,029 |
| | එකතුව | 48,160,204 | 37,798,704 | 28,717,349 | 31,129,217 | 18,011,204 | 12,384,704 | 32,699,811 | 27,047,130 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි, වරිපනම්, ප්‍රාග්ධන ආධාර, කඩ කුලී, කසල බදු , ජල සබඳතා ගාස්තු, ජල ගාස්තු, ත්‍රිරෝද රථ නැවතුම් ගාස්තු හා මන්ත්‍රී දීමනා වල එකතුව රු. 4,401,023 ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු ගිණුම් කඩිනමින් එකතුකිරීම සඳහා ආදායම් පරීක්ෂකවරුන් හට උපදෙස් ලබාදී අතර, ප්‍රතිපූර්ණය පළාත් සභා හා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරමි. |

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු. 2,635,133 ක් සහ හිඟ මුද්දර ගාස්තු 25,218,539 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ මුදල් අය කර ගැනිමට අදාල ආයතන වලට ලිපි යොමු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**<u>තිරසර සංවර්ධන ඉලක්ක</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | අදාල නිලධාරියා දැනුවත් කර ඇත. |

**3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 02 කට අධික කාලයක සිට පැවත එන රු.3,445,206 ක ණයහිමි ශේෂය නිරවුල් කර නොතිබුණි. | ණය හිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | වර්ෂය තුල ගෙවීමට මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා ප්‍රතිපාදන ලද පසු කඩිනමින් ගෙවීම් කරමි. |

**3.3 <u>වත්කම් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 දෙසැම්බර් 17 දින ලැබී තිබුණු රු.7,676,144 ක ගල් රෝල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභාවේ රථගාලේ පවතින අතර, ඒ වෙනුවෙන් 2018 හා 2019 වර්ෂ වලදී රු.245,245 ක අලුත්වැඩියා වියදම් දරා තිබුණි. | වත්කම් නිසි පරිදි උපයෝජනය කළ යුතුවේ. | මෙම ගල්රෝල ක්‍රියාකාරි තත්ත්වයේ නොමැති නිසාත් නඩත්තු වියදම් අධිකවීම හේතුවෙන් වෙනත් පළාත් පාලන ආයතනයකට මාරු කිරීමට පළාත් පාලන කොමසාරිස්ගෙන් ඉල්ලීම් කර ඇත. |

**3.4 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතුවේ. | ඉදිරි වර්ෂය සඳහා සකස් කර ඉදිරිපත් කරමි. |

## 3.5 <u>අභ්‍යන්තර විගණනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් සිදු කිරිමට අදාල විෂය නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති බව දන්වමි. |

## 4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

## 4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඉදිරි වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |